# ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

DMC

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**තනතුරු, අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද**

**01. සහකාර අධ්‍යක්ෂ (අවම කිරීම්) - MM 1-1 - තනතුරු - 01**

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් සිවිල් ඉංජිනේරු හෝ භූ ඉංජිනේරු විද්‍යාව / භූ ගර්භ විද්‍යාව (විශේෂ) උපාධිය හෝ භෞතික විද්‍යා අංශයේ විශේෂ උපාධියක් ලබා ගැනීමෙන් පසුව තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක වසර 03 සේවා පළපුරුද්ද.

**02. සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික්) - MM 1-1 - තනතුරු - 01**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සාමාන්‍ය උපාධික් (විද්‍යා හෝ කලා හෝ වාණිජ හෝ) ලබා ගැනීමෙන් පසුව තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක වසර 03 සේවා පළපුරුද්ද.

**03. සහකාර අධ්‍යක්ෂ (මාධ්‍ය සහ මහජන සම්බන්ධතා) - MM 1-1 - තනතුරු - 01**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ප්‍රථම උපාධියක් ලබා ගැනීමෙන් පසුව තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක වසර 03 සේවා පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් (01, 02 සහ 03 තනතුරු සඳහා)**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කනිෂ්ඨ කළමනාකරණ සේවා ගණයේ පළමුවන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**04. විමර්ශන නිලධාරී - JM 1-1 - තනතුරු - 01**

විශ්වවිදයාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම විෂය ක්ෂේත්‍රයකින් ලබා ගත් උපාධියක් සමග අදාළ විෂය ක්ෂේත්‍රයක වසර 01 ක පළපුරුද්දක් ලබා තිබීම.

**05. දුර දැනීම / භූ තොරතුරු පද්ධති විශ්ලේෂක - තනතුරු - 01**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් මැනුම් විද්‍යාලයකින් මැනුම් විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය

හෝ

විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් සමග භූ විද්‍යාව විෂයක් ලෙස හදාරා තිබීම සහ දුර දැනීම / භූ තොරතුරු පද්ධති විශ්ලේෂණය හා සම්බන්ධ ක්ෂේත්‍රයක වසර 01 ක පළපුරුද්ද.

**06. දත්ත පද්ධති විශ්ලේෂක - තනතුරු - 01**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය

හෝ

විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් සමග පරිගණක විද්‍යාව විෂයක් ලෙස හදාරා තිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ වසර 01 ක පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් - (04 වන තනතුර සඳහා)**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සේවා ගණයේ II වන ශ්‍රේණියේ තනතුරක, ඒ ඒ තනතුරට අදාළ ක්ෂේත්‍රයේ වසර 05 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් - (05 සහ 06 වන තනතුර සඳහා)**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කළමනාකරණ සහකාර (තාක්ෂණික ) සේවා ගණයේ I වන ශ්‍රේණියේ තනතුරක, ඒ ඒ තනතුරට අදාළ ක්ෂේත්‍රයේ වසර 05 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් තිබීම.

| **වැටුප් ක්‍රමය** | | **වයස අවුරුදු** |
|---|---|---|
| MM 1-1 - 2006 | : - රු. 25,640-3x665-7x735-15x925-46,655 | 22 ට නොඅඩු හා 45 ට නොවැඩි |
| MM 1-1 - 2016 | : - රු. 53,175-10x1,375-15x1,910-95,575 | |
| JM 1-1 - 2006 A | : - රු. 20,525-10x365-18x550-34,075 | 22 ට නොඅඩු හා 45 ට නොවැඩි |
| JM 1-1 - 2016 | : - රු. 42,600-10x755-18x1,135-70,580 | |

(කළමනාකරණ චක්‍රලේඛ අංක 2/2016 ට අනුව නව වැටුප් ක්‍රමයන් ක්‍රියාත්මක වීම 2020 වර්ෂයේ සිට සිදු වේ.) අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙහි සඳහන් උපරිම වයස් සීමාවන් අදාළ නොවේ.

**පත්වීම් ස්වභාවය**

ස්ථිර, සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිතය.

**සෑම අපේක්ෂකයෙක්ම,**

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ආ) තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(ඇ) විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**අයදුම්පත් එවිය යුතු ආකාරය -**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ **www.dmc.gov.lk** වෙබ් අඩවියේ පළ කර ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සකස් කර ගන්නා ලද.

අයදුම්පත් 2016-12-02 දින හෝ ඊට පෙර ලැබෙන සේ "**අධ්‍යක්ෂ ජනරාල්, ආපද කළමනාකරණ මධ්‍යස්ථානය, විද්‍යා මාවත, කොළඹ 07**" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**ඉල්ලුම් කරන තනතුර**" පැහැදිලිව සඳහන් කළ යුතුය.

අයදුම්පත්‍රය සමග අධ්‍යාපන සහතික, වෘත්තීය සහතික, සේවා සහතික, උප්පැන්න සහතිකය සහ ජාතික හැඳුනුම්පත ආදියෙහි පිටපත් තමා විසින්ම **සත්‍ය පිටපත්** බවට සහතික කොට එවිය යුතු වේ. තැපෑලේ දී අස්ථානගත වන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳව මෙම මධ්‍යස්ථානය වගකියනු නොලැබේ. කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සඳහාම පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම් කරනු ලැබේ.

දැනටමත් රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය අංශයේ සේවයේ නියුතු වූවත් සිය අයදුම්පත්‍රය ආයතනයේ ප්‍රධානියා මඟින් එවිය යුතු අතර, එසේ නොවන සහ අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් -**

ඉල්ලුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු / ඇය අදාළ තනතුරෙන් පහ කිරීමට පිළිවන.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය**